# බුහුමන් සේවයක - අභිමන් සැමරුම

## ජාතික සමථ දිනය

## 2021




සමථ මණ්ඩල කොමිෂන් සභාව

අධිකරණ අමාත්‍යාංශය

අන්‍යෝන්‍ය වශයෙන් රඳන තැනැත්තන් විසින් දකිනු ලබන පරස්පර විරෝධී ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා වීමේදි එකිනෙකාට කරනු ලබන බාධා කිරීම් තුළින් මතු වන ගැටීම් සියළු සමාජයන්හි ද, ප්‍රජාවන්හි ද, අනිවාර්ය සංසිද්ධියක් ලෙසින් බලාපොරොත්තු විය යුත්තකි. කයින් මෙන්ම මනසින් ද එකිනෙකාට වෙනස් මිනිස් සමාජයක් තුළ එකිනෙකා තුළ ඇති වන අනේක විධ වූ අපේක්ෂාවන් යථාර්ථයක් කර ගැනීමට යාමේදී මතු වන ආරාවුල් සහගත තත්වයන් මෙන්ම එම ආරාවුල් වලට සම්බන්ධ වූ සියළු පාර්ශවයන් තෘප්තිමත් වන අයුරින් ගැටුම් නිරාකරණයට ක්‍රමවේදයක් නොවීම හේතුවෙන් ඇති වන ගැටුම්, ආරාවුල් කරුවන් මෙන්ම සමාජය ද මුහුණ දෙන ප්‍රබල බාධකයක් වී ඇත.

ඒ අනුව දෙපාර්ශවයක් අතර ඇති වන ආරාවුලක් දුර දිග නොයා තෙවන පාර්ශවයක් මැදිහත් වීමෙන් සහමන්ත්‍රණ ක්‍රියාවලියක් තුළින් නැවත එවන් ආරාවුලක් ඇති නොවන මට්ටමට විද්‍යානුකූල පදනමකින් යුක්ත නිරවුල් කිරීමකට එළඹීමට යොදා ගන්නා ඵලදායී ක්‍රමවේදයක් ලෙසින් සමථකරණය හැඳින්විය හැකිය. මේ අනුව ආරාවුලක අවසානය විනාශයක් නොවී ධනාත්මක ප්‍රවේශයකින් යුක්ත නිමාවක් කරා ගෙන යාමට සහ ආරාවුලට සම්බන්ධ දෙපාර්ශවයටම දිනන - දිනන විසඳුමකට මඟ විවර කර දීමට සමථකරණය තුළින් හැකියාව ලැබෙනු ඇත.

මෙවන් මානව හිතවාදි සේවාවක් තුළින් ගැටුම් අවම සමාජයක් නිර්මාණය කිරීමට දිවයින පුරා සමථ මුල මණ්ඩලවල නිස්සරණාධ්‍යාසයෙන් කටයුතු කරනු ලබන සමථකාරවරුන් ඉතා ප්‍රශස්ත කාර්යභාරයක් ඉටු කරනු ලබන අතර එවන් වූ අභිමන් සේවයක නිරත වන සමථකරුවන් හා සමථකරණ ක්‍රියාවලිය අගයනු වස් පැවැත්වෙන ජාතික සමථ දිනය ජූලි මස 18 වන දිනට යෙදී ඇත.

පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුමේ ජාතික සමථ දිනය සැමරීමට නොහැකි වුවද, ජාතික සමථ දිනය තේමා කර ගනිමින් සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශණයට අනුව රජය සැලසුම් කර ඇති පරිදි " නීතිගරුක හා විනය ගරුක සමාජයක් ඇති කිරීමට අධිකරණ ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීමෙන් සැලසෙන පහසුකම් මගින් අධිකරණ පද්ධතිය තුළ ප්‍රමාදවීම් වළක්වා ගැනීමට පියවර ගන්නා අතරම, සිවිල් ආරවුල් අධිකරණය දක්වා නොගොස් නිරවුල් කර ගැනීමට සමථ මණ්ඩල ක්‍රියාවලිය තව දුරටත් බල ගැන්වීම " සඳහා සුවිශේෂී තීරණයන් කිහිපයක් රජය විසින් ක්‍රියාවට නංවා ඇත.

ඒ අනුව වසරකට සමථ මුල මණ්ඩල වලට ලැබෙන ලක්ෂ 03 ක් පමණ වන ආරවුල් අතරින් සාකච්ඡාවට බඳුන් කරනු ලබන ආරවුල් අතරින් 70% ක ප්‍රතිශතයකින් ගැටළු නිරවුල් කිරීමට කැප වන දිවයින පුරා විසිර සිටින 5000 ක් පමණ වන සමථකාරවරන්ගේ හා සමථකාරවරියන්ගේ ප්‍රශංසනීය සේවාව

අගයනු වස් 2013 වසරේ සිට සමථකාරවරුන් සඳහා රජය මගින් ලබා දුන් රුපියල් 500.00 වන සහභාගිත්ව දීමනාව 2021 වසරේ ජුලි මස 18 වන දිනට යෙදෙන ජාතික සමථ දිනයේ  සිට 100% ක ප්‍රතිශතයකින් ඉහළ නංවමින් රු 1000.00 ක් දක්වා වැඩි කිරීමට කටයුතු කර ඇත.

එමෙන්ම සිවිල් ආරවුල් සමථකරණයට යොමු කිරීමේ ක්‍රියාවලිය තව දුරටත් ව්‍යාප්ත කිරීම සඳහා පහසුකම් සැලසීමක් ලෙස, මෙතෙක් ජනතාව විසින් සමථ මුල මණ්ඩල සභාපතිවරුන් වෙත පමණක් යොමු කළ  පෞද්ගලික ආරවුල්  ජාතික සමථ දිනයට සමගාමීව දිවයින පුරා සෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකම ස්ථාපිත කරනු ලබන " පැමිණිලි පෙට්ටි " වෙතට යොමු කිරීමට ද අවස්ථාව සැලසෙනු ඇත. ඒ අනුව ආරවුල යොමු කරන පුද්ගලයාගේ නම හා ලිපිනය, ආරවුලට සම්බන්ධ අනෙත් පාර්ශවයේ නම හා ලිපිනය සමග  ආරවුල කෙටියෙන් සඳහන් කර රුපියල් 5.00 මුද්දරයක් අවලංගු වන සේ අත්සන් කළ කෙටි ලිපියක් මගින් ඕනෑම පුද්ගලයකුට තම පෞද්ගලික ආරවුලක් සමථ මුල මණ්ඩලයට යොමු කිරීමේ හැකියාව ලැබෙනු  ඇත.

දිවයිනේ සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක  සමථ මුල මණ්ඩල වල සමථකාරවරුන් හා සමථකාරවරියන් ගේ සේවය අගයනු වස් සහ  සමථකරණ ක්‍රියාවලිය තව දුරටත් සමාජගත කිරීමේ අරමුණු පෙර දැරිව වඩා සුපසන් සාමකාමී සමාජයක් බිහි කිරීමට වර්තමානයේ ක්‍රියාත්මක සමථකරණ ක්‍රියාවලිය  සාධනීය පියවරයන් කිහිපයන් ඔස්සේ ජනතාව අතරට ප්‍රවේශ කරලීමටත් සමථකරුවන් සතු විභවතාවන් හා කුසලතාවන් සංවර්ධනය තුළින් සමථකරණ ක්‍රියාලිය විද්‍යානුකූල ප්‍රවේශයකින් යුක්ත ව සමාජ ගත කිරීමෙන්  අඩු කාලයක් හා අඩු වියදමකින් ගැටළු නිරවුල් කර ගැනීමට ජනතාවට මං පෙත් විවර කර දීම  මෙම ජාතික සමථ දිනයේ දී සමථ මණ්ඩල කොමිෂන් සභාවේ සහ අධිකරණ අමාත්‍යාංශයේ ඒකායන අභිප්‍රායයි.